**පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණ කළමනාකරණ භාරය - 2017**

-----------------------------------------------------------------------------------------------

පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 2010 ජුනි 03 දිනැති අංක අමප/10/0958/438/001 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 ඔක්තෝබර් 31 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යාවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ භාරයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-------------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලන තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 31 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

--------------------------------------

අවසන් වරට භාරය විසින් පිළියෙල කරන ලද 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාරයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
| --- | --- |
| **වත්කම්** | **රු.** |
| ජංගම නොවන වත්කම් | 1,917,763,213 |
| ජංගම වත්කම් | 110,694,262 |
| මුළු වත්කම් | **2,028,457,475** |

**බැරකම්**

**--------**

| | |
|---|---|
| ජංගම බැරකම් | 5,182,315 |
| ජංගම නොවන බැරකම් | 85,080,000 |
| ශුද්ධ වත්කම්/අයිතිය | 1,938,195,160 |
| | ------------------ |
| **මුළු බැරකම්** | **2,028,457,475** |
| | ========== |
| මුළු ආදායම් | 117,718,311 |
| මුළු වියදම් | (130,446,796) |
| | -------------- |
| ඌනතාවය | (12,728,485) |
| | ======== |

**2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-------------------------------------**

2014 අගෝස්තු 01 සිට වර්ෂ 05 ක කාලපරිච්ඡේදයක් සඳහා මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ දෛනිකව එකතුවන අපද්‍රව්‍ය ඉවත් කිරීමට හා ඒ සඳහා දින ගණනට අදාළවන ගෙවීම් කිරීමට පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගතව තිබුණි. 2017 වර්ෂයේ මැයි හා ජුනි මාසවල අපද්‍රව්‍ය ඉවත්කිරීමට අදාළ දින ගණන පමණක් ඊට අදාල ගොනුවේ සඳහන් කර තිබුණු අතර ඒ සඳහා රු. 987,981 ක් ගෙවා තිබුණි. 2017 වර්ෂයේ අනෙකුත් මාස සඳහා රු. 4,073,255 ක් ගෙවා තිබුණද, දෛනිකව අපද්‍රව්‍ය ඉවත් කර ඇත්ද යන්න නිරීක්ෂණය කල බවට හෝ ගෙවීම් නිවැරදි ද යන්න පිළිබඳව පරීක්ෂා කිරීමට හෝ ප්‍රමාණවත් වාර්තා භාරය සතුව නොතිබුණි.

**2.4 ප්‍රමාණවත් අධිකාරි බලයක් තහවුරු නොවූ ගනුදෙනු**

**-----------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 අගෝස්තු 10 දින කළමනාකරණ භාරය පිහිටුවීමේ දී ඇතිකර ගත් ගිවිසුමේ 6(අ)(1) ඡේදය ප්‍රකාරව භාරයේ සියලුම ඉතිරිකිරීම් හෝ අතිරික්ත මුදල් වෙනත් යම් ආකාරයකින් ආයෝජනය කිරීමට විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව පූර්ව ලිඛිත අනුමැතිය ලබාගෙන සියලුම ඉතිරිකිරීම් හෝ අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල හෝ ආණ්ඩුවේ සුරැකුම්පත්වල ආයෝජනය කළයුතු බවට දක්වා ඇතත්, 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 160 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. එහෙත් ඒ සඳහා භාණ්ඩාගාරයේ ලිඛිත අනුමැතියක් ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක එස්ඊසී/1/3/1/ජීඊඑන් හා 2011 මාර්තු 01 දිනැති ලිපියෙන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සැලසුම් සහකාර නිලධාරිනියක් මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ සම්බන්ධීකරණ නිලධාරි (අලෙවි ප්‍රවර්ධන) ලෙස පත්කර තිබුණි. ආයතන සංග්‍රහයේ සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අනුකූල නොවී භාරයේ අනුමැතිය මත පමණක් 2011 මාර්තු සිට 2017 දෙසැම්බර් දක්වා එම නිලධාරිනියට ගෙවා තිබූ මුළු දීමනා එකතුව රු.2,479,000 ක් විය.

(ඇ) කළමනාකරණ භාරයේ සාමාජිකයෙකු වූ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුර දරණ අයෙකුට කළමනාකරණ භාරයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට අමතරව ගෙවීම් අනුමැතිය ලබාදීම හා චෙක්පත්වල දෙවෙනි අත්සන්කරු ලෙස කටයුතු කිරීම වෙනුවෙන් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මසකට රු.12,500 බැගින් දීමනාවක් ගෙවීමට 2015 මැයි 22 දින කළමනාකරණ භාර මණ්ඩල රැස්වීමේ දී තීරණය කර තිබුණි. ලබාදී ඇති පිළිතුර අනුව භාර මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති බව දන්වා ඇති මුත් භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන 2017 වර්ෂය වෙනුවෙන් ද එකතුව රු. 150,000 ක් ගෙවා තිබුණි.

## 2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2013 අංක 17 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 10 වගන්තිය | 2015 හා 2016 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 95 ක හා රු.මිලියන 91 ක සහ සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 96 ක බදුකුලී ආදායමක් භාරය උපයාගෙන තිබුණ ද එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 395 (ආ)(ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මාසික මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් වෙන වෙනම ගණනය කර රු.13,953,214 ක් මුදල් පොතේ හර ශේෂය යැයි දක්වා විගණනයට ඉදිරිපත් කළ නමුත් 2017 දෙසැම්බර් 31 දිනට මුදල් පොත තුලනය කර ඉදිරියට ගෙනැවිත් නොතිබුණි. එමෙන්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර යුතු වුවත් 2017 වර්ෂයට අදාළව බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 880 | භාරයේ මුදල් භාරගැනීම සහ මුදල් භාරව සිටින නිලධාරීන් සහ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංවර්ධන කටයුතු හා ව්‍යාපාරික වශයෙන් ඇති වාණිජ කටයුතු වෙන වෙනම හඳුනා ගනිමින් භාරයේ ශක්තීන් මෙන්ම දුර්වලතා මනා ඇගයීමට ලක්කරමින් සහ ව්‍යාපාරික පරිසරයේ ඇති අවස්ථාවන් හා බාධක පිළිබඳ මනා ඇගයීමක් සිදු කරමින් භාරයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උචිත ක්‍රමෝපායන් හඳුනා ගැනීමක් සිදු කර නොතිබුණි. තවද, කළමනාකරණ භාරය ආරම්භයේ සිටම ඉදිරි වර්ෂ සඳහා අඛණ්ඩ වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කළයුතු වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම 2017 වර්ෂය සඳහා ද භාරය විසින් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව පිළියෙල කළයුතු වාර්ෂික අයවැය ලේඛනය 2014 වර්ෂයේ සිට පිළියෙල කර නොතිබුණි.

### 3.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

-------------------------------------

භාරය විසින් ඉටුකළ යුතු කාර්යභාරයන් සම්බන්ධයෙන් ඒවායේ නිමැවුම් මට්ටම මැනීම හා ප්‍රතිඵලය ඇගයීම සඳහා අවශ්‍ය කාර්යසාධන දර්ශක සකසා නොතිබීම හේතුවෙන් ඉටු කළ කාර්ය භාරයන්හි නිමැවුම් මට්ටම හා ප්‍රතිඵලයන් ඇගයීම සිදුකළ නොහැකි විය.

### 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 ජූනි 03 සිට කළමනාකරණ භාරය වෙනම ආයතනයක් ලෙස ස්ථාපිත කර තිබියදී භාරය සතු වෙළඳ පරිශ්‍රයේ රථවාහන අංගනයේ ආදායම් එකතු කිරීම ලංකා ධීවර සංස්ථාව විසින් 2011 මාර්තු 07 දින සිට වර්ෂ 10 ක කාලයකට පෞද්ගලික සමාගමකට බදු දී තිබුණි. එමෙන්ම ලිඛිතව ගිවිසුමකට එළඹීමකින් තොරව භාරයේ පතුරු අයිස් නිෂ්පාදනාගාරය භාරය ආරම්භ කළ 2011 වර්ෂයේ සිට රු. 3,900,000 ක වාර්ෂික බදු මුදලකට ලංකා ධීවර සංස්ථාවට ලබාදී තිබුණි.

(ආ) 2016 වර්ෂය තුළ කැට අයිස් අලෙවි කිරීම වෙළඳ සමාගමක් විසින් ආයතන පරිශ්‍රය තුළ සිදු කළද ඒ සඳහා ලිඛිත ගිවිසුමට එළඹ නොතිබුණු අතර ඒ වෙනුවෙන් රු.518,000 ක හිඟ මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවතිණි. එමෙන්ම 2017 වර්ෂය තුළ කැට අයිස් අලෙවි කිරීම ධීවර සංස්ථාව විසින් සිදු කර තිබුණද ඒ සඳහා ලිඛිත ගිවිසුමකට එළඹීමක් හෝ ගාස්තු අය කිරීමක් සිදු කර නොතිබුණි.

(ඇ) කළමනාකරණ භාරයේ වර්ග අඩි 1,375 ක් පමණ වූ ඉඩ ප්‍රමාණයක් 2017 වර්ෂයේ සිට ධීවර සංස්ථාවට ප්‍රයෝජනයට ගැනීම සඳහා ලබාදී තිබුණ ද ඒ සඳහා ලිඛිත ගිවිසුමක් හෝ ගාස්තු අයකිරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් 2010 මැයි 14 දින ඉදිරිපත් කරන ලද පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරය පිහිටුවීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2010 ජූනි 03 දින අනුමැතිය ලැබී තිබුණි. එකී තීරණය ප්‍රකාරව කළමනාකරණ භාරය පිහිටුවා තිබුණ ද, විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 30 වන විටත් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිගත කිරිමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඉ) මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය තුළ මසුන් ගබඩා කිරීම, සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මකභාවයෙන් නියමිත ප්‍රමිතියට පවත්වා ගැනීම සහතික කිරීමට අවශ්‍ය පියවර ගැනීම හා වෙළඳ සංකීර්ණය තුළ හා අවට පරිසර දූෂණය අවම වන පරිදි මහජනයාට ගැවසිය හැකි පරිසරයක් සකස් කර නොතිබුණි.

(ඊ) වෙළඳ සංකීර්ණයට හා එම පරිශ්‍රයේ ඇති සත්ව ආහාර නිෂ්පාදනාගාරයට පාරිසරික බලපත්‍රයක් ලබාදීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් දන්වා ඇති නිර්දේශයන් භාරය විසින් ඉටුකිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2017 වර්ෂය සඳහා පාරිසරික බලපත්‍ර විගණන අවස්ථාව වූ 2018 සැප්තැම්බර් 28 දිනවන විටත් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) භාරයේ පාලනයට යටත් තොග වෙළඳ කුටි පිළිබඳව වූ බදු ගිවිසුමට අනුකූල නොවී බදුගත් වෙළඳසැළක් හෝ කොටසක් උකස් කිරීමට හෝ විකිණීමට හෝ හුවමාරු කිරීමට හෝ අයිතියක් බදු ගැණුම්කරු වෙත නොමැති බව දක්වා තිබුණි. එහෙත් වෙළඳ ව්‍යාපාරිකයින්ට බදු පදනම මත ලබා දී තිබුණු වෙළඳසැල් 154 ක් අතරින් වෙළඳසැල් 19 ක බදු ගැණුම්කරුවන් විසින් 2016 සිට 2018 අගෝස්තු 13 කාල පරාසය තුළ බාහිර පාර්ශවයන් වෙත වෙළඳ සැල් 19 ක් පවරා තිබුණි. මෙකී වෙළඳසැල් භාරයට පවරා නැවත බදු දීම වෙනුවට පැවරු එක් වෙළඳ කුටියකින් රු. 500,000 ක් බැගින් වෙළඳසැල් 19 වෙනුවෙන් එකතුව රු. 9,500,000 ක් භාරය විසින් ලබාගෙන තිබුණි. 2016 වර්ෂයට පෙර එසේ පවරා තිබූ වෙළඳසැල් 26 ක් වූ අතර ඒවායින් කිසිදු මුදලක් කළමනාකරණ භාරය අය කර ගෙන නොතිබුණි.

(ඌ) භාරයේ මාසික සාමාන්‍ය වියදම රු.මිලියන 4.5 ත් රු.මිලියන 6 ත් අතර පරාසයක පැවති අතර සෑම මාසයක් අවසානයේදීම මුදල් පොතට අනුව රු.මිලියන 13 ක සාමාන්‍ය අතිරික්ත මුදලක් පැවතුණි.මෙසේ අතිරික්ත මුදල් වෙනත් වාසිදායක ආයෝජන ක්‍රියාවලියක යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ වෙළඳසැල් 154 කින් යුතුව ඉදිකර තිබුණු තොග වෙළඳ සංකීර්ණයක් හා වෙළඳසැල් 128 කින් යුත් සිල්ලර වෙළඳ සංකීර්ණයක් පැවති අතර 2011 හා 2012 වර්ෂවල දී රු.9,625,540 ක් වැයකර සිල්ලර වෙළඳ සැල් අතරින් 64 ක් තොග වෙළඳසැල් බවට පරිවර්තනය කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විටත් සිල්ලර අංශයේ වෙළඳසැල් 64 ක් හා සිල්ලර අංශයේ තොග වෙළඳසැල් 46 ක් වෙළඳ කටයුතු සඳහා බදු දී නොතිබුණි.

**3.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ කළමනාකරණ භාරය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සේවකයින් 43 යුත් කාර්යය මණ්ඩලයක් අනුමත කරවාගෙන තිබුණ ද ඒ සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටියට විගණන අවස්ථාව වූ 2018 ජනවාරි 16 දිනවන විටත් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) කළමනාකරණ භාරයේ සේවයේ නියුතු 40 ක් වූ කාර්ය මණ්ඩලයෙන් 37 දෙනෙක් ලංකා ධීවර සංස්ථාවෙන් අනුයුක්ත කරන ලද ස්ථිර සේවකයන් හා තිදෙනෙකු ලංකා ධීවර සංස්ථාවෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් වූ අතර මෙම සේවකයන්ට අදාළ සියළු වැටුප් හා දීමනා භාරය විසින් දරා තිබුණි.

(ඇ) භාරයේ කළමනාකරණ හා ගණකාධිකරණ තනතුරු සඳහා ස්ථිර සේවකයන් බඳවාගෙන නොතිබූ අතර කළමනාකරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත සහ ගණකාධිකාරී තනතුර සඳහා අමාත්‍යාංශයේ ගණකාධිකාරී වරයෙකු වැඩ බැලීමේ පදනම මත යොදවාගෙන තිබුණි.

## 4. තිරසාර සංවර්ධනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය තම කාර්යයන් සම්බන්ධව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වීම් මැන බැලීම් සඳහා වන දර්ශකයන් හඳුනා ගෙන තිබුණු බවට තොරතුරු ඉදිරිපත් විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව කළමනාකරණ භාරයේ අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා පද්ධති හා පාලනය ශක්තිමත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

### 5.2. ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 5.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සෑම ප්‍රසම්පාදන කටයුත්තකටම පෙර මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කළයුතු බවට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 මාර්ගෝපදේශය මඟින් උපදෙස් ලබාදී තිබුණද රු.663,564 ක ජල පවිත්‍රාගාරයේ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

2016 විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබූ පහත නිරීක්ෂණ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග විගණන දින වූ 2018 ඔක්තෝබර් 31 වන විටත් ගෙන නොතිබුණි.

| | ඡේද අංකය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | 4.4 (අ) ඡේදය | - | ආපන ශාලාව සඳහා 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.1,143,868 ක් වූ ශීතකරණ 03 ක් භාවිතයට ගැනීමෙන් තොරව ආපන ශාලාව තුළ තිබීම. |
| (ආ) | 4.2 (ඊ) ඡේදය | - | භාරය ආරම්භ කර වසර 6 ක් ඉක්මවා තිබුණ ද පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය පිහිටි අක්කර 7 රූඩ් 3 පර්චස් 14.9 ක් වූ ඉඩම භාරය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබීම. |

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්‍ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර අමාත්‍යාංශයේ ලේකම්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | (i) බැංකු සැසඳුම් නියමිත පරිදි පිළියෙල කර නොතිබීම. |
| | (ii) මුදල් පොතේ සටහන් චෙක්පත් උපපත්‍රිකා සමඟ නොසැසඳීම සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව සහතික නොකල වවුචර් පැවතීම හා ගෙවීම් නොකිරීම. |
| | (iii) අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුවන ආකාරයට කාර්යය පැවරුම් සිදුකර නොතිබිම. |
| | (iv) සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂන වාර්තාවල සමීක්ෂණ මණ්ඩලයේ සමාජිකයින් අත්සන් කර නොතිබීම හා පාවිච්චි කල නොහැකි භාණ්ඩ ගැන වාර්තා කර නොතිබීම |
| (ආ) ආදායම් පාලනය | (i) සියලු වෙළඳ කුටි බදු දීමට කටයුතු නොකිරිම. |
| | (ii) වෙළඳ කුටි අතුරු බදු දීමට ඉඩ හැරීම. |
| | (iii) නිවැරදිව බදු ආදායම් ලබා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම. | (i) ස්ථාවර වත්කම් ලේඛනය, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය, විදුලි උපකරණ ලේඛනය, හානි පිළිබඳ ලේඛනය, ඇප ලේඛනය ආදි ලේඛන පවත්වා නොතිබීම. |
| | (ii) භාර මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු වාර්තා කිරීම සඳහා වාර්තා පොතක් පවත්වා නොතිබීම. |
| | (iii) සමාලෝචිත වර්ෂයට අදාළ ලෙජර් ගිණුම්, පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබීම. |